# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022

### 2025 ජුනි / ජූලි

### මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ සංස්කෘතිය

**සමයාන්තර චින්තා සහ බුදුදහම ථෙරවාද හා මහායාන සම්ප්‍රදාය BUCU – E 3025**

කොටස් දෙකෙන්ම ඇතුළත් වන පරිදි ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

## I කොටස

01. සමාජ විද්‍යාඥයින්ගේ නිර්වචන ඇසුරින් ආගම යනු කුමක්දැයි අර්ථකථනය කොට, ආගමේ කාර්යභාරය පෙන්වා දෙන්න.

02. ක්‍රිස්තියානි දහමේ ප්‍රභවය හා විකාශය දක්වා, කිතු දහමේ මූලිකාංග පැහැදිලි කරන්න.

03. ක්‍රිස්තියානි ධර්මය ව්‍යාප්ත කිරීමෙහිලා කටයුතු කළ චින්තකයන් පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

04. ඉස්ලාම් දහමේ දැක්වෙන ඒකදේවවාදය යන්න පැහැදිලි කොට, එම දහමේ සඳහන් සමාජ සදාචාරය පිළිබඳ ඉගැන්වීම් ගෙනහැර දක්වන්න.

05. හින්දු ආගමේ ප්‍රභවයට උපස්ථම්භක වී ඇති මූලාශ්‍රය පැහැදිලි කොට, හින්දු දහමට අභිමත වූ දේව විශ්වාසය විවිධ ස්ථරයන්හි ක්‍රියාත්මක වන ආකාරය සනිදර්ශනව පැහැදිලි කරන්න.

## II කොටස

06. මහායාන බෞද්ධ සම්ප්‍රදායේ ප්‍රභවය අහඹු සිදුවීමක් දැයි පරීක්ෂා කරන්න.

07. මහායාන ධර්මයට අනුව බෝධිසත්ත්වවරයෙකු විසින් සම්පූර්ණ කළ යුතු ධර්මතා මොනවාදැයි පෙන්වා දෙන්න.

08. මහායාන සාහිත්‍ය හඳුන්වා, වෛපුල්‍ය සූත්‍ර අතුරින් දෙකක් පිළිබඳ ප්‍රමාණවත් විස්තර ඉදිරිපත් කරන්න.

09. ථෙරවාදය යන්න අර්ථකථනය කොට, එහි අනන්‍යතා ලක්ෂණ කවරේදැයි පරීක්ෂා කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට (02) ප්‍රමාණවත් විවරණ සපයන්න.

    i. ත්‍රිකාය
    ii. බුද්ධඝෝෂ තෙරුන් වහන්සේ
    iii. ක්‍රිස්තියානි උත්සව
    iv. ඉස්ලාම් නීති ක්‍රමය

*****************************